"රැක්මට මුල්තැන"

# රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ්

(ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධිත)

வரையறுக்கப்பட்ட ரக்னா அரக்‌ஷக லங்கா

# Rakna Arakshaka Lanka Ltd

(Affiliated to the Ministry of Defence)

Reg. No PB 456

අංක. 143/ඒ, කිරුළපන ඇවනිව්, කොළඹ 05. | இல. 143/A, கிருலபன அவென்யூ, கொழும்பு 05. | No.143/A, Kirulapone Avenue, Colombo 05.

RALL/PROCUREMENT/2026/92 (      )

බලපත්‍රලාභී සියලු රක්ෂණ ආයතන,

2026 ජුනි මස 18 දින.

**<u>සමුද්‍ර ආරක්ෂක නිළධාරීන් වෙනුවෙන් රක්ෂණාවරණයක් ලබා ගැනීම සඳහා මිලගණන් කැඳවීම.</u>**

01. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආරක්ෂක සමාගමක් වන අතර, ආරක්ෂක නිළධාරීන්ගෙන් බහුතරයක් ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාමලත් හා නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වූ හමුදා සාමාජිකයින් වේ. ආරක්ෂක කටයුතුවලට අමතරව සනීපාරක්ෂක සේවා හා ආහාර සැපයීමේ ව්‍යාපාරයත් මෙම සමාගම වෙතින් පවත්වාගෙන යනු ලබන අතර, ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් වේ.

02. මෙම සමාගමේ සේවය කරන සමුද්‍ර ආරක්ෂක නිළධාරීන් සහ ඒ හා සබැඳි කාර්‍ය මණ්ඩලය සමුද්‍ර මෙහෙයුම් රාජකාරීන්හි නියැලෙන කාල පරාසය ආවරණය වන පරිදි රක්ෂණාවරණයක් ලබා ගැනීම වෙනුවෙන් මිලගණන් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| අ. | මිලගණන් කැඳවීම් අංකය | - | RALL/PROCUREMENT/2026/92 |
| ආ. | මිලගණන් කැඳවීම් දිනය | - | 2026.06.18 දින |
| ඇ. | මිලගණන්පත් භාර ගැනීමේ අවසන් දිනය හා වේලාව | - | 2026.07.02 දින 1330 පැයට |
| ඈ. | මිලගණන් විවෘත කරන දිනය හා වේලාව | - | 2026.07.02 දින 1400 පැයට |
| ඉ. | මිලගණන් විවෘත කරන ස්ථානය | - | සී/ස රක්නා ආරක්ෂක ලංකා මූලස්ථානය, නො.143/ඒ, කිරුළපන ඇවනිව්, කොළඹ |

03. සමුද්‍ර ආරක්ෂක නිළධාරීන් සඳහා වන රක්ෂණාවරණය වෙනුවෙන් මෙම සමාගම වෙතින් ලබාදෙනු ලබන ප්‍රසම්පාදන අයදුම්පත්, 2026.06.22 දින සිට 2026.07.01 දින දක්වා සතියේ වැඩකරන දිනයන්හි පෙ.ව 0830 සිට පස්වරු 0400 දක්වා සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම, අංක 143/ඒ, කිරුළපන ඇවනිව්, කොළඹ 05 යන ස්ථානය වෙත පැමිණ ඒ සඳහා නම්කර ඇති පහත විස්තර සඳහන් නිළධාරීන් වෙතින් රු. 1,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා ලබාගත හැක.

බ්‍රිගේඩියර් එස්එම්ඩබ්බිඑන් තලගහවත්ත ඒටීඕ (විශ්‍රාමික)
ප්‍රධානි - කාර්ය සම්පාදන
දුරකථන අංකය - 070 - 4100059

ලුතිනන් කොමාන්ඩර් (විශ්‍රාමික) පිපිඑස් ප්‍රේමරත්න එම්ඒ, බීඒ
කළමණාකරු - ප්‍රසම්පාදන
දුරකථන අංකය - 070-1560401

04. අදාල ප්‍රසම්පාදන අයදුම්පත් ඔබ විසින් ලබාගත් පසු රක්ෂණය සබැඳිව පූර්ණ අවබෝධයකින් යුතුව නිසි අයුරින් සකසන ලද මිලගණන්පත් ලිපි කවරයක බහා මුද්‍රා තබා ආරක්ෂිතව (ඔබ ආයතනයේ ලිපිශීර්ෂයක ආවරණ ලිපියක් සහිතව) මිලගණන්පත් වසනු ලබන දිනය දක්වා ඇති වේලාවට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ රැගෙන විත් මෙම ආයතනයේ L මහලේ (Lobby) හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත බහාලීමට කටයුතු කල යුතුය. මිල ගණන්පත් ඉදිරිපත් කිරීමේදී "සමුද්‍ර ආරක්ෂක නිළධාරී රක්ෂණාවරණය සඳහා මිලගණන් ඉදිරිපත් කිරීම" යනුවෙන් සහ මිලගණන් කැඳවීමේ අංකය, මිලගණන් විවෘත කරන දිනය හා වේලාව ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර තිබිය යුතුයි.

05. ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් සම්පූර්ණ හෝ කොටස් වශයෙන් පිලිගැනීමක් සිදුකිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව/සභාපති සතුවන අතර එම තීරණය අවසාන තීරණය වේ. තෝරාගත් රක්ෂණ ආයතනය වෙත නිළ වශයෙන් දැනුම් දීමක් සිදුකරනු ලබන අතර තෝරා නොගත් රක්ෂණ ආයතන වෙත ඒ සම්බන්ධව කිසිදු දැනුම් දීමක් සිදුකරනු නොලැබේ.

ස්තුතියි.

ලුතිනන් කොමාන්ඩර් (විශ්‍රාමික) පීපීඑස් ප්‍රේමරත්න එම්ඒ, බීඒ
කළමණාකරු - ප්‍රසම්පාදන
සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම

දුරකථනය / தொலைபேசி / Telephone | General : 0112 674 815 | CIMSTA : 0332 247 522
ෆැක්ස් / தொலைநகல் / Fax | Operation : 0112 674 814 | Maritime : 0112 674 816 | CIMSTA : 0332 247 522
E-mails | General : info@rall.lk | Maritime : imaritime@rall.lk | CIMSTA : cimsta@rall.lk | Operation : operations@rall.lk | Restaurants : restaurant@rall.lk | Cyber Security : cyber@rall.lk
Website www.rall.lk